මගේ අංකය : SG/Admin/CS/5/18 – Annual Transfer (External) -2020
ඒකාබද්ධ සේවා අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2020.02. 14 දින

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්;
සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්/අධ්‍යක්ෂ (මැ.සි.ආ.)/අධ්‍යක්ෂ(මුදල්)/ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් / මිනින්දෝරු අධිකාරීවරුන්,
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරි,
කාර්මික හා පරිපාලන නිලධාරීවරුන් / පරිපාලන නිලධාරි,
ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ප්‍රධානීන්,

**ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා තීරණ**
**සංවර්ධන නිලධාරී සේවය/ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APL/1/AT/2019 හා 2020.02.13 දිනැති ලිපිය අනුව, වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කළ නිලධාරීන්ගේ අභියාචනා පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ මෙයින් දැනුම් දෙමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබාදී ඇති මෙම අභියාචනා හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කර නොමැති ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ 2020 වාර්ෂික ස්ථාන මාරුවීම් අතරින් ක්‍රියාත්මක වියයුතු දින සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියළු ස්ථාන මාරු 2020.02.20 දින සිට ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වමි.

03. තවද ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් එසේ ලබාදී ඇති දිනවල සිට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු බවද වැඩිදුරටත් දන්වමි.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අදාළ නිලධාරීන්ට දන්වා ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එස්.ඩී.පී.ජේ. දාම්පෙගම
සර්වේයර් ජනරාල්

එස්.ඩී.පී.ජේ. දාම්පෙගම
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/1/AT/2019
ඔබේ අංකය / உமது இல. / Your No.: COM/Trans/ වා.ස්.මා./2020
දිනය / திகதி / Date: 2020.02. 13

ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා වලට අදාළ තීරණ දැනුම් දීම**
**<u>සංවර්ධන නිලධාරි සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය</u>**

ඉහත සඳහන් සේවාවන්හි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කර නොමැති ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ 2020 වාර්ෂික ස්ථාන මාරුවීම් අතරින් ක්‍රියාත්මක විය යුතු දින සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියළු ස්ථාන මාරු 2020.02.20 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව, ඉහත සඳහන් සේවාවන්වල 2020 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයන් ලබා දී ඇති ස්ථාන මාරුවීම් එසේ ලබා දී ඇති දින වල සිට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතුවේ.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේවුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

05. 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියළුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදාහැරීමට කටයුතු කිරීම සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි නව සේවා ස්ථාන වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු සම්බන්ධයෙන් එම නිලධාරියා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව, තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07. තවද, 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යාංශ වෙනස් වීම හේතුවෙන් යම් නිලධරයකු ස්ථාන මාරුවිය යුතු සේවා ස්ථානය පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් පවතින අවස්ථාවකදී, අදාළ නිලධරයා අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධරයා සේවයේ යෙදී සිටින ස්ථානය ඔහුගේ/ඇයගේ නව සේවා ස්ථානය විය යුතු බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එම්.ජේ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත :
අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් - කාරුණික දැන ගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා

## ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2020
## රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා තීරණ

**සංවර්ධන නිලධාරී**

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | ජේ.එම්.එස්.එන්. ජයසුන්දර මිය | සංවර්ධන නිලධාරී III | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, පුත්තලම | නැත | නව බඳවාගැනීමකදී අනුප්‍රාප්තිකයෙකු ලබාදී වාර්ෂික නොවන ස්ථාන මාරු යටතේ අභියාචක වෙත ස්ථාන මාරුවක් ලබාදෙන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම. |
| 2 | වී. නන්දනී මිය | සංවර්ධන නිලධාරී III | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, කිලිනොච්චිය | නැත | නව බඳවාගැනීමකදී අනුප්‍රාප්තිකයෙකු ලබාදී වාර්ෂික නොවන ස්ථාන මාරු යටතේ අභියාචක වෙත ස්ථාන මාරුවක් ලබාදෙන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම. |
| 3 | ඩී.ඒ. චමිල් මහතා | සංවර්ධන නිලධාරී III | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, හම්බන්තොට | නැත | නව බඳවාගැනීමකදී අනුප්‍රාප්තිකයෙකු ලබාදී වාර්ෂික නොවන ස්ථාන මාරු යටතේ අභියාචක වෙත ස්ථාන මාරුවක් |
| 4 | ඒ.එච්.එම්.පී. අබේරත්න මිය | සංවර්ධන නිලධාරී III | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, පුත්තලම | නැත | නව බඳවාගැනීමකදී අනුප්‍රාප්තිකයෙකු ලබාදී වාර්ෂික නොවන ස්ථාන මාරු යටතේ අභියාචක වෙත ස්ථාන මාරුවක් ලබාදෙන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම. |
| 5 | පී.පී.ඩී.ඩී.එස්. අමරසිංහ මිය | සංවර්ධන නිලධාරී III | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, කුරුණෑගල | නැත | නව බඳවාගැනීමකදී අනුප්‍රාප්තිකයෙකු ලබාදී වාර්ෂික නොවන ස්ථාන මාරු යටතේ අභියාචක වෙත ස්ථාන මාරුවක් ලබාදෙන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම. |
| 6 | එම්.ඒ.එච්. මලවීර ආරච්චි මිය (යූ.එම්.අයි. දිල්හානි මියගේ අනුප්‍රාප්තිකයා) | සංවර්ධන නිලධාරී III | ගොවිජන සේවා මධ්‍යස්ථානය, මැද උයන්ගොඩ | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, මාතර | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම. |

# ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2020
## රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා තීරණ

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය - 3 පන්තිය**

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | පී.ඒ.ටී. පුෂ්පලතා මිය (ඩී.ඩබ්.එස්.ඒ. මාරපන මියගේ අනුප්‍රාප්තිකයා) | SLICTS 3 - II | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය - රත්නපුර) | නැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |